# 7 වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නව රාජධානි බිහි වීම

## හැඳින්වීම

උතුරුමැද වියළි කලාපයට අයත්ව තිබූ පැරණි අනුරාධපුර නගරයත් දකුණු වියළි කලාපයට අයත් තිබූ මාගම නගරයත් දීර්ඝ කාලයක් තිස්සේ අසිරිමත් පුරවර ලෙස ක්‍රියාත්මකව පැවතිණි. එම නගර බිහිවීමට අදාළ පසුබිම ගැන ඓතිහාසික මූලාශ්‍රය විස්තර කර තිබේ. නිදසුනක් ලෙස දක්වන්නේ නම් අනුරාධ ග්‍රාමය ලෙස කලක් පැවති තැන අනුරාධපුරය නමින් හැඳින්වෙන නගරය බවට පරිවර්තනය කිරීමට පණ්ඩුකාභය රජු සමත් වූ බව මහාවංසය සඳහන් කරයි. කලින් පැවති ගමක් නගරයක් ලෙස වර්ධනය වීම ගැන ඓතිහාසික මූලාශ්‍රයවල දැක්වන්නේ ඉතා නිවැරදි අදහසකි. ඇත්ත වශයෙන් ම නගරයක් ලෙස වර්ධනය වන්නේ ග්‍රාමීය ජනාවාසයකි.

ග්‍රාමීය ජනාවාසයක් නාගරික ජනාවාසයක් දක්වා වර්ධනය වීම ඉතා දීර්ඝකාලීන වූත් ක්‍රමානුකූල වූත් ක්‍රියාවලියකි. එහි දී සිදු වන්නේ මිනිසුන්ගේ ජීවන ශෛලිය ග්‍රාමීය ස්වරූපයක සිට නාගරික ස්වරූපයක් තෙක් වෙනස්වීම්වලට ලක් වීම යි. එසේ සිදුවීම දීර්ඝකාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එක් අතකින් එම ක්‍රියාවලිය සඳහා රට අභ්‍යන්තරයේ ඇතිවන ආර්ථික දියුණුව සෘජුව ම බලපවත්වයි. අනෙක් අතින් විදේශ රටවල් සමඟ ඇති කර ගන්නා වෙළෙඳ සබඳතා ද එම ක්‍රියාවලිය සඳහා තීරණාත්මක බලපෑමක් ඇති කරයි. මෙම පාඩම මගින් ශ්‍රී ලංකාවේ පැරණි නගර බිහිවීම සහ ඒවා අවනතියට යාම පිළිබඳ කරුණු විස්තර කරනු ඇත.

## 7.1 නාගරික ජීවිතයේ පසුබිම

ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණය පිළිබිඹු වන්නේ උතුරුමැද වියළි කලාපයට අයත් අනුරාධපුරය සහ දකුණු හා ගිණිකොන දිග ශ්‍රී ලංකාවේ පිහිටි පැරණි මාගම නගරයෙනි. ක්‍රිස්තු පූර්ව 450 පමණ වන විට මෙම නගර දෙක වර්ධනය වීමේ මූලික ලක්ෂණ පහළ වී තිබිණි. එයින් අදහස් කරන්නේ නගරයකට අවශ්‍ය කරන පවුරු, දිය අගල්, වීදි ආදිය ගොඩනැගී තිබුණු බව පමණක් නොවේ. නගරයක ජීවත් වීමට අවශ්‍ය කරන ජීවන තත්ත්වයක් තිබෙන ජනගහනයක් නිර්මාණය වී තිබීම යි.

මේ රටේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික ප්‍රජාව සිය සංචාරක දඩයම් ජීවිතය අතහැර ඒ වෙනුවට ගොවිතැන ප්‍රධාන කොට ගත් ජීවිතයකට හුරු වීම පෙන්නුම් කරන සාක්ෂි ක්‍රිස්තු පූර්ව 2400 තරම් ඈතකට අයත් වන බව දෙවන පාඩමේ දී ඉගෙන ගැනීමට ඔබට අවස්ථාවක් ලැබිණි. ගොවිතැනට පුරුදු වීම නිසා ඒ කාලයේ සමාජයේ ඇති වූ ප්‍රධාන වෙනස්කමක් වූයේ ස්ථිරවාසීතාව ඇති වීම ය. ස්ථිරවාසීතාව යනු එක් තැනක දිගු කාලයක් ජීවත් වීම යි. මේ රටේ පැරණිතම ගම් බිහි වීමට මූලික වූයේ මේ කාරණය යි.

මේ මූලික ගම්වල විසූවන් සිය ජීවනෝපාය ලෙස ගොවිතැනත්, සත්ත්ව පාලනයත් කර ගෙන ගිය පිරිසකි. මීට සමගාමීව දඩයම් කිරීම ද පැවතිණි. ගොවිතැන සහ සත්ත්ව පාලනය නිසා ඔවුන්ගේ එදිනෙදා ආහාර සුරක්ෂිතතාව තහවුරු විය. නියගය, ගංවතුර, සතුන් අතර පැතිර යන වසංගත රෝග ආදි ස්වභාවධර්මය මගින් ඇති කරන උවදුරුවල බලපෑමට හසු නොවන්නට මෙම වෘත්තීන් දෙකේ නිරතව සිටි මිනිසුන්ගේ ජීවිතය සාමකාමී සහජීවනයකින් යුක්ත විය.


දීර්ඝකාලීනව ගොවිතැන් කටයුතුවල යෙදීමෙන් ඒ ඒ ජනාවාසවල වාසය කළ පුද්ගලයින් අතර එක් පැහැදිලි වෙනස්කමක් ඇති වන ලකුණු පහළ වෙමින් තිබිණි. එය ගොවිතැන් කළ ඉඩම්වල ස්වභාවය, ගොවිතැන් කටයුතු කළමනාකරණයේ දී එක් එක් පුද්ගලයා විසින් දක්වන ලද නිපුණතාව ආදි කරුණු රැසක් මත පදනම් විය.

ජලය මැනවින් ලැබෙන සරු පසක් සහිත ඉඩම් වල ගොවිතැන් කළ ගොවීන්ට හොඳ අස්වැන්නක් හිමි වූ අතර එතරම් සරු නොවන ඉඩම් වගා කළ අයට ඇතැම් විට වර්ෂය පුරා ජීවත්වීමට තරම්වත් අස්වැන්නක් ලබා ගත නොහැකි විය. අස්වැන්න සරු වූ පුද්ගලයින්ට වර්ෂය පුරා ප්‍රයෝජන ගැනීමෙන්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

*සැලසුම අංක 7.1 පැරණි අනුරාධපුර නගරයේ සැලැස්ම දක්වන සටහනක්*




පසුව ඉතිරි වීමට තරම් ධාන්‍ය අටුවල තිබිණි. මෙම ඉතිරි වන කොටස හඳුන්වන්නේ නිෂ්පාදන අතිරික්තය යන විශේෂ වචනයෙනි. සමාජයක් තුළ නිෂ්පාදන අතිරික්තයක් ඇති වීම සහ එමගින් අතිරික්ත හිමියන් පිරිසක් බිහි වීම යනු එකී සමාජය තුළ විශාල පරිවර්තනයක් ඇති කරවන සුලු තත්ත්වයකි. මෙලෙස අතිරික්ත හිමියන් මෙරට පුරාණ සමාජයේ වාසය කළ බව පෙන්වා දීමට සුදුසු එක් උදාහරණයක් ජාතක අට්ඨකථාවේ දක්නට තිබේ. එහි සඳහන් කර ඇති අන්දමට එක් කන්නයකින් නියමිත අස්වැන්න නොලැබීමෙන් ආහාර හිඟ වූ ගැමියෙක් ඒ ගමේ ගම්නායකයා හමු වී ඊ ළඟ කන්නයේ දී නැවත ආපසු දෙන පොරොන්දුව මත වී මල්ලක් ඔහුගෙන් ඉල්ලා ගනී. ජාතකට්ඨ කථාවේ සඳහන් මෙම පුවත අපේ රටේ පැරණි සමාජය තුළ සිදු වෙමින් තිබූ පෙර කී සමාජ වෙනස දක්වෙන කදිම ඉඟියකි. එක් පැත්තකින් ගොවිතැන් කටයුතු අඩාළ වීම නිසා දුප්පත් වූ ගැමියා ගැනත් ඔහු වැනි අයට ආර්ථික වශයෙන් උදව් කළ හැකි අතිරික්ත හිමියා ගැනත් අදහසක් එයින් අපට ලැබේ.


ඉහත දක්වෙන මූලාශ්‍රයේ විස්තර වන අතිරික්ත හිමියා ගම් නායකයෙකු බව දක්වා තිබීමෙන් අප විසින් වටහා ගත යුතු එක් වැදගත් කාරණයක් තිබේ. එනම් ඔහුට නායක පදවිය හිමි වීමට බලපෑ ප්‍රධාන හේතුව ඔහු ආර්ථික වශයෙන් සමෘද්ධිමත් පුද්ගලයෙකු වීම යි. 'පරුමක' සහ 'බත' යනුවෙන් හඳුන්වා ඇති තවත් ඒ ආකාරයේ ම ප්‍රාදේශික නායකයින් ගැන සෙල්ලිපිවල තොරතුරු සඳහන් ය. පරුමකවරු පිළිබඳ විස්තරයක් තෙවන පාඩමේ දී ඉදිරිපත් කර තිබිණි.

ආර්ථික හැකියා පදනම් කර ගෙන මෙලෙස ධනවතුන් සහ දුප්පතුන් ලෙස සමාජය බෙදී යාම හඳුන්වන්නේ සමාජ ස්තරායනය බිහි වීම යනුවෙනි. නගර ඇති වීමට පදනම් වූ එක් වැදගත් ක්‍රියාවලියක් ලෙස සැලකිය හැක්කේ මෙලෙස සමාජය ස්තරවලට වෙන් වීම යි.

## 7.2 පළමුවන නාගරීකරණය

ක්‍රිස්තුපූර්ව 450 පමණ වන විට අපේ රටේ සමාජය තුළ සමාජ ස්තරායනය යම් දුරකට සම්පූර්ණත්වයකට පත් ව තිබිණි. ඒ කාලය වන විට නිෂ්පාදන අතිරික්තයට හිමිකම් කී ප්‍රාදේශීය ප්‍රභූන් විශාල පිරිසක් වියළි කලාපයේ පුරා පැතිරී සිටි බව මුල්කාලීන සෙල්ලිපිවලින් තහවුරු වේ. දැනට හඳුනා ගෙන තිබෙන සෙල්ලිපිවල පරුමක යන වචනයෙන් හඳුන්වා ඇති පුද්ගලයින් ගණන විශාල සංඛ්‍යාවකි. මේ ප්‍රභුවරු පවුල් වශයෙන් සංවිධානය වී සිටියෝ ය. මෙම ප්‍රභූ පවුල් තම තමන්ගේ පවුල්වලට අයත් කීර්තිය පවත්වා ගෙන යාම සඳහා යොදා ගත් එක් උපක්‍රමයක් වූයේ තමන්ගේ බල මහිමය පෙන්වනු වස් විදේශවලින් ආනයනය කරන ලද භාණ්ඩ පරිහරණයට පෙලඹීම යි. අනුරාධපුරය සහ තිස්සමහාරාමය ආදී පුරාණ නගරවල කර තිබෙන කැණීම්වල දී විදේශවලින් ආනයනය කරන ලද මැටි භාණ්ඩ පබළු ආදි දේ සොයා ගෙන තිබේ. මෙවැනි දේ හුවමාරු වන්නේ විදේශීය වෙළෙඳාමට සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් ලෙස යි.

ඉන්දියානු සාගරයේ එවක ක්‍රියාත්මකව පැවති අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවලට සක්‍රිය ලෙස සහභාගි වීම නිසා විශාල ධනයක් රට තුළට ගලා ආවේය. නිෂ්පාදන අතිරික්තයේ හිමිකරුවන් වූ සුළුතර පිරිසට සෙසු බාහිර ප්‍රශ්න නොවූයෙන් තමන්ගේ ජීවිතය සුඛෝපභෝගී ලෙස පවත්වා ගෙන යාමට අවකාශය ලැබිණි. රට තුළට ගලා එන ආදායම පරිපාලනය කිරීමට අවශ්‍ය හෙයින් පාලන යාන්ත්‍රණයක අවශ්‍යතාව ඇති විය. අතිරික්ත හිමිකම නිසා සමාජයේ ප්‍රභූත්වය හිමිකර ගත් පිරිස් මැනවින් සැලසුම් කරන ලද ජනාවාසයකට ගොනු වූහ. වීදි, වෙළෙඳපළවල්, යාතුකර්ම සඳහා අවශ්‍ය ආගමික ගොඩනැගිලි, සෞන්දර්යාත්මක උද්‍යාන, ආරක්ෂක ප්‍රාකාර සහ ජලාශවලින් සමන්විත එවැනි ජනාවාසයක් නගරයක් යනුවෙන් හැඳින්වෙයි. පැරණි අනුරාධපුර නගරය එවැනි සැලසුම් සහගත නිමාවකින් යුක්තව පැවති බව පණ්ඩුකාභය රජු ඒ නගරය සැලසුම් කළ ආකාරය පිළිබඳව මහාවංසය කරන විස්තරයෙන් සනාථ වේ.




*සැලසුම අංක 7.2 පැරණි පොළොන්නරුව නගරයේ සැලැස්ම දක්වන සටහනක්*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*ඡායාරූපය අංක 7.1 නටබුන්ව වල්වැදී තිබෙන ථූපාරාම ස්තූපය. අනුරාධපුර නගරය බිඳ වැටීමෙන් පසු මෙවැනි ස්මාරක සියල්ල ම නටබුන් බවට පත් විය. මෙම ඡායාරූපය මෑත කාලයේ ප්‍රතිසංස්කරණවලට පෙර ගන්නා ලද්දකි.*

ගම්වැසි ගොවියන් විසින් නිපදවන ලද ආහාර සහ සත්ත්ව නිෂ්පාදනවලින් ස්වයංපෝෂණය වීමත් ලෝහ කර්මාන්තය වාරි තාක්ෂණය ඇතුළු වෙනත් කර්මාන්තවල දීර්ඝ කාලයක් කාර්යක්ෂම ලෙස නියැළීමත් හේතුකොට ගෙන වසර 1400 කට ආසන්න කාලයක් අනුරාධපුරය දිවයිනේ අගනගරය ලෙස ක්‍රියාත්මකව පැවතිණි. දකුණු පළාතේ පිහිටි මාගම නගරය ද ඒ පළාතේ සංස්කෘතික දියුණුව පිළිබිඹු කරන කැටපතක් බවට පත් විය.

ක්‍රිස්තු වර්ෂයෙන් හයවන සියවසින් පසු ඉන්දියානු සාගරය හරහා ක්‍රියාත්මක වෙමින් පැවති අන්තර්ජාතික වෙළෙඳාම අරාබි වෙළෙඳුන් අතට පත් විය. ඉන්දියානු සාගර වෙළෙඳ කටයුතුවල එතෙක් පැවති භූගෝලීය අවධානය වූ ඉන්දියානු සාගරයේ බටහිර කොටස තවදුරටත් පුළුල් කරමින් ඊට අග්නිදිග ආසියාව සහ දකුණු චීනය ද ඈඳා ගැනිණි. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසින් පසුව ඉන්දියානු සාගරයේ වෙළෙඳාම ඉන්දියානු සාගරයේ නැගෙනහිර කොටසට කේන්ද්‍රගත වෙමින් පැවතිණි. මේ වෙනස මගින් ඇති කරන ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට හිමිකර ගැනීමට නම් නැගෙනහිර වෙරළේ පිහිටි වරායවල් සක්‍රිය කිරීමත් ඒ වරායවල් හරහා රට තුළට ඇදී එන ආදායම පාලනය කිරීමටත් ඒ ස්ථාන හරහා පැමිණෙන විවිධාකාර පුද්ගලයින්ගෙන් රටේ ආරක්ෂාවට ඇති විය හැකි තර්ජන වළකා ගැනීමටත් පාලනය සඳහා එම වෙරළ තීරයට වඩා සමීපස්ථ නගරයක් පාදක කර ගැනීමේ අවශ්‍යතාවත් අපේ දූරදර්ශී පාලකයෝ අවබෝධ කර ගෙන සිටියහ. පළමුවන විජයබාහු රජතුමා පළමුවරට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට මෙම තත්ත්වය ඍජු ලෙස ම බලපෑමක් ඇති කළ බව පෙනේ.

විජයබාහු රජුගෙන් අනතුරුව රජ පැමිණි පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ සමයේ පැවති සමාජ වටපිටාව සහ විදේශ සම්බන්ධතා පරීක්ෂාවෙන්

විමසන විට නව අග්නිදිග ආසියාතික වෙළෙඳ සබඳතා ඒ වකවානුවේ ශ්‍රී ලංකාවේ දේශපාලනික, ආගමික සහ ආර්ථික කටයුතු වෙත කුමන අන්දමේ බලපෑමක් ඇති කළේ ද යන කාරණය පැහැදිලි වෙයි. මහාවංසය සඳහන් කරන අන්දමට පළමුවන විජයබාහු රජුගෙන් පසුව රජ පැමිණි කිහිප දෙනෙක් බුරුමය සහ කාම්බෝජ යන ආසියාතික රටවල රාජකීය කාන්තාවන් විවාහ කර ගත්හ. පොළොන්නරු යුගය ලෙස ගැනෙන කාලපරිච්ඡේදය තුළ මෙරට නිර්මාණය වූ කලා කෘතිවල, එනම් නිදසුනක් ලෙස බුද්ධ ප්‍රතිමා සහ ඇතැම් වාස්තු විද්‍යාත්මක නිර්මාණවල අග්නිදිග ආසියාතික ලක්ෂණ මැනවින් ඉස්මතු වී තිබේ. පොළොන්නරුව ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා සහ පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල ඊට ගැළපෙන හොඳ ම නිදසුන් දෙකකි.



*ඡායාරූපය අංක 7.2 පොළොන්නරුවේ තිවංක පිළිම ගෙය මෑත කාලයේ ප්‍රතිසංස්කරණවලට පෙර පැවති ආකාරය. පොළොන්නරුව නගරය බිඳවැටීමෙන් පසුව මෙවැනි ස්මාරක වල්බිහි විය (ඡායාරූපය ටයිම්ස් චිත්‍රාගාරයේ අවසරයෙනි.*

## 7.3 පොළොන්නරුව බිඳ වැටීම

අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා වූ පස්වන මිහිඳු රජුගේ කාලයේ දී චෝල ආක්‍රමණ එල්ල වී එම රාජධානිය බිඳ වැටුණු අතර අනතුරුව පළමුවන විජයබාහු රජතුමා චෝලයන්ගෙන් රට නිදහස් කර ගෙන පොළොන්නරුව අගනුවර බවට පත් කර ගනිමින් රට එක් සේසත් කළේය. පළමුවන විජයබාහු රජුගේ අභාවයෙන් පසුව උද්ගත වූ අභ්‍යන්තර ගැටලු නිසා පැවති දේශපාලන ව්‍යාකූලතා අවසන් කර නැවත වරක් රට එක්සේසත් කරන ලද්දේ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසිනි. එතුමා පොළාන්නරුව අගනුවර තවදුරටත් සංවර්ධනය කොට රට පුරා වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරවා නැවත වරක් මෙරට සමෘද්ධිමත් යුගයක් උදා කළේය. එහෙත් පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ අභාවයෙන් පසුව උද්ගත වූ දේශපාලන ව්‍යාකූලතා නිසා පොළොන්නරු රාජධානිය ක්‍රමයෙන් පරිහානිය කරා ගමන් කළ බව පෙනේ. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව වසර 9 ක තරම් කාලයක් ශක්තිමත් පාලනයක් ගෙන යන ලද්දේ නිශ්ශංකමල්ල රජතුමා පමණි. මෙසේ පොළොන්නරු රාජධානිය ක්‍රමයෙන් පරිහානිය කරා යාමට හා අවසානයේ එය බිඳ වැටීමට තුඩු දුන් හේතු කිහිපයක් තිබේ.

### 1. දුර්වල පාලකයන් බලයට පත් වීම.

පළමුවන පරාක්‍රමබාහු රජුගේ අභාවය සිදු වූ වර්ෂ


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

1186 සිට පොළොන්නරු රාජධානිය බිඳ වැටුණු වර්ෂ 1215 දක්වා 29 වසර තුළ පාලකයන් 12 දෙනෙකු පමණ වරින් වර බලයට පත් ව ඇත. මේ අතරින් නිශ්ශංකමල්ල රජුගේ වසර 9 ක පාලන කාලය හැරුණු විට සෙසු සියලු දෙනාගේ රාජ්‍ය කාලය ඉතා කෙටි කාලවලට සීමා විය. මෙයින් පෙනෙන්නේ එම පාලකයන්ට දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට නොහැකි වූ බවයි. එය පොළොන්නරු යුගයේ පරිහානියට හේතු විය.

## 2. කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය

පළමුවන විජයබාහු රජුගේ අභාවයෙන් පසුව මෙරට සිටි කාලිංග වංශිකයන් හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගල උත්සන්න විය. මේ නිසා කාලිංග වංශයට හිතවත් පිරිස් එම වංශයට අයත් පාලකයන් බලයට පත් කිරීමට ක්‍රියා කළ අතර පාණ්ඩ්‍ය වංශිකයෝ තමන්ට හිතවත් නායකයන් බලයට පත් කිරීමට වෙහෙසුණහ. මෙහි ප්‍රතිඵල වශයෙන් කාලිංග වංශිකයන් එම වංශයට අයත් නිශ්ශංකමල්ල රජුගේ අභාවයෙන් පසුව එතුමාගේ බෑනා (සහෝදරියගේ පුතා) වූ චෝඩගංග සහෝදරයා වූ සහාසමල්ල, බිසව වූ කල්‍යාණවතී වැනි අය වරින් වර බලයට පත් කොට ඇත. පාණ්ඩ්‍ය වංශිකයෝ පළමුවන පරාක්‍රමබාහු රජුගේ බිරිඳ වූ ලීලාවතී බිසව තුන්වරක් බලයට පත් කළහ. මෙසේ කාලිංග පාණ්ඩ්‍ය බල අරගලය රාජධානියේ පරිහානියට හේතු විය.

## 3. ආර්ථික පරිහානිය.

නිශ්ශංකමල්ල රජුගේ අභාවයෙන් පසුව දුර්වල පාලකයන් බලයට පත් වීමත්, ඔවුන්ට දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට නොහැකි වීමත් නිසා එකල පැවති වැව් අමුණු පද්ධතිය නිසි පරිදි නඩත්තු නොකළ බව පෙනේ. දේශපාලන ව්‍යාකූලතා පැවති මෙම කාල පරිච්ඡේදයේ දී ප්‍රාදේශීය පරිපාලනය ද දුර්වල වන්නට ඇත. එමගින් කෘෂිකාර්මික පරිහානියත්, වෙළෙඳාම අඩපණ වීමත් සිදු වී ආර්ථික පිරිහීමකට මගපෑදුණි.

## 4. කාලිංග මාඝගේ ආක්‍රමණය

පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ කාලිංග මාඝගේ ආක්‍රමණයයි. මාඝ විශාල හමුදවක් සහිතව වර්ෂ 1215 දී මෙරට ආක්‍රමණය කරන විට රටේ පැවති දුර්වල දේශපාලන වාතාවරණය නිසා ආක්‍රමණික හමුදවට මුහුණ දීමේ හැකියාවක් ලාංකිකයන්ට නොතිබුණි. එහි ප්‍රතිඵල වශයෙන් පොළොන්නරු නගරය හා රජරට ප්‍රදේශ රැසක් මාඝගේ හමුදව යටතට පත් විය. මාඝගේ ආක්‍රමණය නිසා සිදු වූ විනාශයත්, උද්ගත වූ ප්‍රතිඵලත් සලකා බලන විට එය පොළොන්නරුව අගනුවර කෙරෙහි පමණක් නොව වසර එක්දහස් පන්සියයකට නො අඩු රජරට ශිෂ්ටාචාරයෙහි ඉරණම කෙරෙහි ද ප්‍රබල බලපෑමක් ඇති කළ බව පෙනේ.

මෙම ආක්‍රමණය නිසා සිදු වූ විනාශය විස්තර කෙරෙන මහාවංස පාඨයක් මෙසේය.

- "(ආක්‍රමණිකයෝ ......) මිනිසුන් බැඳ දමා වධ කොට ධනය පැහැරගෙන දිළින්දන් කළහ. ප්‍රතිමා බිඳ හෙලූහ, චෛත්‍ය විනාශ කළහ, විහාර කොල්ලකෑහ, උපාසකයන්ට පහර දුන්හ, දරුවන්ට තැළූහ." මෙසේ සතුරු හමුදව අනුගමනය කළ විනාශකාරී කටයුතු නිසා රජරට ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂාව නැති විය.

උද්ගත වූ ප්‍රතිඵලය වූයේ පීඩාවට පත් භික්ෂූන් වහන්සේලා ඇතුළු සෙසු ජනතාව ආරක්ෂාව පතා රුහුණට, මලය රටට (කඳුකරයට) හෝ මායා රටට සංක්‍රමණය වීම යි. මේ නිසා රජරට බොහෝ ප්‍රදේශ ජන ශූන්‍ය විය. මධ්‍යගත පාලනයෙන් ගිලිහුණු ඇතැම් පෙදෙස් වන්නි ප්‍රදේශ බවට පත් විය. දහස් ගණන් ජනතාව දිනපතා වන්දනාමාන කළ රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය වැනි සිද්ධස්ථාන ක්‍රමයෙන් වල් බිහි විය. රජරට ප්‍රදේශයේ ජනාකීර්ණව පැවති නගර බොහොමයක් නටබුන් බවට පත් විය.

පැරණි නගර පරිහානියට හේතු

- සතුරු ආක්‍රමණ.
- මධ්‍යගත පාලනය බිඳ වැටීම.
- ආරක්ෂාව නැති වීම.
- වෙළෙඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම.
- ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම.

## 7.4 දෙවන නාගරීකරණය

වියළි කලාපයේ පැවති නගර ඒවායේ පැවති සමෘද්ධියෙන් පිරිහීමට පත් වීමත් සමඟ නොබෝ කලකින් වියළි කලාපයෙන් පිටත විශේෂයෙන් නිරිත දිග ප්‍රදේශවල තවත් නගර කිහිපයක් පැන නැගෙනු දකිය හැකි ය. මෙම නගර බිහිවීම තවත් නාගරීකරණ

ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. දේශපාලන බලය විමධ්‍යගත වීම නිසා පාලන මධ්‍යස්ථාන කිහිපයක් සමකාලීනව ක්‍රියාත්මක වීම, නව වරායවල් වර්ධනය වීම, සාහිත්‍යයේ කැපී පෙනෙන පුනර්ජීවනයක් ඇති වීමෙන් නව බුද්ධි ප්‍රබෝධයක් පිළිබිඹු වීම යන මෙම ක්‍රියාවලිය දෙවන නාගරීකරණයක් ලෙස හැඳින්වීමට ප්‍රමාණවත් පදනමක් සපයයි. නව වෙළෙඳ සම්බන්ධතා ජාලයක් නිර්මාණය වීමත් එමගින් වාණිජ කටයුතුවල පුළුල් වීමක් දක්නට ලැබීම ද මේ කාලයේ ඇති වූ නාගරික වර්ධනය සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු තවත් වැදගත් ප්‍රවණතාවකි.

දෙවන නාගරීකරණ ක්‍රියාවලියේ දී බිහි වූ නගර ඊට පෙර යුගයේ පැවති මහා නගර සමඟ සන්සන්දනය කරන විට පෙනෙන ප්‍රධාන විශේෂතාව වන්නේ දෙවන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගරවල සැලසුම් පෙර පැවති ජ්‍යාමිතික සැලසුම් ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයකට පරිවර්තනය වූ බව යි. පරිමාණය අතින් සලකන විට වුව ද ඒවා අනුරාධපුරය, පොළොන්නරුව මෙන් මහා පරිමාණ ස්වරූපයක් පෙන්නුම් නොකරයි. මෙම වෙනසට හේතුව දෙවන නාගරීකරණයෙන් පසු බලය විමධ්‍යගතව පැවතීම විය හැකි යැයි විද්වත්හු පෙන්වා දෙති.

### දඹදෙණිය

වර්ෂ 1215 දී පොළොන්නරු රාජධානිය බිඳ වැටීමේ සිට වර්ෂ 1232 දී දඹදෙණි රාජධානිය පිහිටුවන තෙක් කාල පරිච්ඡේදය මෙරට ඉතිහාසයේ අවුල් වියවුල් සහිත අවධියකි. රටේ අගනුවර සතුරන් අතට පත් ව තිබූ මෙම දුෂ්කර කාල පරිච්ඡේදයේ දී ඇතැම් ස්වදේශීය නායකයන් ආරක්ෂිත ස්ථානවල දුර්ග පිහිටුවාගෙන ශාසනයත් රටත් සතුරන්ගෙන් රැක ගත් බව මහාවංසයේ සඳහන් වේ. යාපහුව කඳු මුදුනෙහි එබඳු දුර්ගයක් පිහිටුවාගෙන එම ප්‍රදේශය සතුරන්ගෙන් රැකගත් සුභ සෙනෙවියා, රුහුණෙහි, ගෝවින්දමලය නම් කඳු මුදුනෙහි බලකොටුවක් තනාගෙන සතුරන් රුහුණට ඇතුළු වීම වළක්වමින් සිටි බුවනෙකබාහු ආදිපාදවරයා හා මහියංගනය ආසන්න ප්‍රදේශයෙහි ගංදෙණිය පර්වතයේ දුර්ගයක් පිහිටුවාගෙන සිටි සංඛ සෙනෙවියා මේ අතරින් කැපී පෙනේ.

මෙලෙස රටේ ආරක්ෂාව වෙනුවෙන් මහත් වෙහෙසක් ගෙන ක්‍රියා කළ ද තම බල ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමේ අරමුණ මිස ඉන් ඔබ්බට ගොස් සතුරා මර්දනය කොට රට එක්සේසත් කිරීමේ අදහසක් ඒ කිසිවකු තුළ නොවූ බව පෙනේ. එවැනි අදහසක් පෙරදැරි කර ගෙන කටයුතු කළ පුද්ගලයෙකු ලෙස පෙනෙන්නේ එවක දඹදෙණියේ වාසය කළ තුන්වන විජයබාහු නමැති ප්‍රභූවරයා යි. හෙතෙම ක්‍රිස්තු වර්ෂයෙන් 12321236 අතර කාලවකවානුවේ දී දඹදෙණිය සිය පාලන මධ්‍යස්ථානය කර ගනිමින් පාලනය ගෙන ගියේය. ඒ කාලය තුළ දඹදෙණිය නගරයකට අවශ්‍ය කරන අංගෝපාංගවලින් සමන්විතව වර්ධනය විය.


වර්ෂ 1232 දී දඹදෙණි රාජධානිය පිහිටුවන ලද්දේ තෙවන විජයබාහු රජතුමා විසිනි. රජරට පැරණි රජ පවුලට මෙතුමාගේ තිබූ සබඳතාව කුමක් දැ යි පැහැදිලි නැත. මේ රජු මුල් කාලයේ දී වන්නි නායකයෙකු වශයෙන් කටයුතු කළ බව මූලාශ්‍රය වල  සඳහන් වේ. වන්නි යනු රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහි වූ ප්‍රාදේශීය පාලන ඒකක විශේෂයකි. මේ අනුව විජයබාහු රජු ද මුල් අවධියේ ප්‍රාදේශීය පාලකයෙකු වශයෙන්  සිට ක්‍රමයෙන් බලයක් ගොඩනගා ගෙන මායා රට සිටි සතුරන් පලවාහැර දඹදෙණිය රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස ගොඩනැගූ බව පෙනේ. පොළොන්නරුව සතුරන්ට යටත් වීමත් සමඟ දන්ත ධාතුව හා පාත්‍ර ධාතුව ආරක්ෂා කළ භික්ෂූන් වහන්සේලා එම පූජනීය වස්තු කොත්මලයට ගෙන ගොස් සඟවා තබා ඒවා ආරක්ෂා කළහ.  මේ බව දැනගත් තුන්වන විජයබාහු රජතුමා එකී පූජනීය වස්තු දඹදෙණි රාජ්‍යයට වැඩමවා බෙලිගල දළඳ මැඳුරක් කරවා ඒවා එහි තැන්පත් කරවීය. දළදාව හිමි වීම නීත්‍යානුකූල රාජ්‍යයත්වය ලැබීමක් ලෙස ජනතාව සැලකූ බැවින් රජුගේ එම ක්‍රියාවෙන් දඹදෙණි රාජධානියට නව වැදගත්කමක් ලැබුණි. දඹදෙණියේ විජයසුන්දරාරාමය තැනවීම, කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවීම, උපසම්පද මංගල්‍යය යළි පවත්වා සංඝ සංශෝධනයක් කරවීම හා අභාවයට ගොස් තිබූ පොතපත නැවත ලියවීම වැනි ආගමික හා ජාතික කටයුතු රැසක් ද තෙවන විජයබාහු රජු විසින් කරවන ලදී. මෙතුමාගේ රාජ්‍ය කාලය වසර 4 ක් වූ අතර වර්ෂ 1236  දී හෙතෙම අභාවයට පත් විය.

### දෙවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1236- 1270)

තෙවන විජයබාහු රජුට පරාක්‍රමබාහු හා බුවනෙකබාහු යනුවෙන් පුතුන් දෙදෙනෙක් සිටි අතර එම රජුගේ

අභාවයෙන් පසු වැඩිමහල් පුත් පරාක්‍රමබාහු කුමරු වර්ෂ 1236 දී දඹදෙණියේ රජකමට පත් විය. එතුමා දෙවන පරාක්‍රමබාහු රජු ලෙස හැඳින්වේ. දෙවන පරාක්‍රමබාහු රජු ළමා කාලයේ දී හොඳ අධ්‍යාපනයක් ලැබූ අයෙකි. පිය රජු ජීවත්ව සිටි අවධියේ දී සංඝරක්ඛිත මාහිමියන් ප්‍රමුඛ මහා සංඝයාගෙන් අධ්‍යාපනය ලැබූ එතුමා පසුව උගත් පඬිරුවනක් බවට පත් විය. මේ නිසා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ එතුමා සම්පාදනය කළ විශිෂ්ට ග්‍රන්ථ අද දක්වා ඉතිරිව පවතී.

දෙවන පරාක්‍රමබාහු රජු බලයට පත් වන විටත් රට සතුරු ආක්‍රමණිකයන්ගෙන් නිදහස්ව නොතිබුණි. එසේම අලුත් ආක්‍රමණිකයෙකුට මුහුණ දීමට ද එතුමාට සිදු විය. රටේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම, ආගමික හා අධ්‍යාපනික උන්නතියකට කටයුතු කිරීම ඇතුළු තවත් අභියෝග රැසක් එතුමා හමුවේ පැවතිණ. එහෙත් රජතුමා උගතෙකු හා බුද්ධිමතෙකු වූ බැවින් මේ සියලු අභියෝග ජය ගැනීමට එතුමා සමත් විය.



*සැලසුම අංක 7.3 පැරණි යාපහුව නගරයේ සැලැස්ම දක්වන සටහනක්*

දෙවන පරාක්‍රමබාහු රජතුමා කාලිංග මාඝ හා සටනට සූදානම් වෙමින් සිටි අවධියේ එනම් එතුමාගේ එකොළොස් වන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව. 1247) චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයෙක් විශාල හමුදාවක් සමඟ මෙරටට ගොඩ බැස්සේය. ශ්‍රී ලංකාවට මෙතෙක් සියලු ආක්‍රමණ එල්ල වූයේ ඉන්දියාවේ සිට වුවත් චන්ද්‍රභානු පැමිණියේ අග්නිදිග ආසියාතික ප්‍රදේශයක් වූ මලය අර්ධද්වීපයේ උතුරු ප්‍රදේශයෙනි. එකල එම ප්‍රදේශය බෞද්ධ රටක් වූ හෙයින් චන්ද්‍රභානුගේ අරමුණ වූයේ බෞද්ධ පූජනීය වස්තු අත්පත් කර ගැනීම විය හැකි ය. ක්‍රි.ව 1247 දී දෙවන පරාක්‍රමබාහු රජුගේ මෙහෙයවීම මත ලාංකික හමුදාව විසින් චන්ද්‍රභානුගේ හමුදාව පලවා හරින ලදී.

දෙවන පරාක්‍රමබාහු රජු මුහුණ දිය යුතු ප්‍රබල ම අභියෝගය වූයේ මාඝගේ පාලනයෙන් රජ රට මුදවා ගැනීමයි. වසර 40 ක් පමණ රජරට ප්‍රදේශ පාලනය කළ මාඝ අවට බලකොටු පිහිටුවා අරක්ෂාව තර කොට තිබුණි. මේ නිසා මාඝට එරෙහිව තීරණාත්මක ප්‍රහාරයක් එල්ල කළ යුතු විය. රජුගේ සැලසුමකට අනුව හමුදාව යොදවා නැගෙනහිර හා බටහිර දෙසින් පොළොන්නරු නගරය වටකොට ඇත. රජුගේ හමුදාවට මුහුණ දීමට මාඝගේ භටයෝ අවට බලකොටුවල සිට පොළොන්නරුවට රැස්වී සිටියහ. රජුගේ හමුදාව එල්ල කළ ප්‍රබල ප්‍රහාරයෙන් මාඝගේ හමුදා අන්ත පරාජයක් ලබා ඇත. මේ තීරණාත්මක සටන වර්ෂ 1255 දී පමණ සිදු වූ බව පිළිගැනේ. මාඝගෙන් රජරට මුදවා ගැනීම දෙවන පරාක්‍රමබාහු රජු ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි.

මීට පෙර රජුගේ හමුදාව සමඟ සටන් කොට පැරදී පලා ගිය චන්ද්‍රභානු ඉන්දියාවෙන් ද කුලී හමුදා ලබා ගෙන වර්ෂ 1261 දී පමණ නැවත වරක් දඹදෙණිය ආක්‍රමණය කළේය. විශාල හමුදාවක් සහිතව දඹදෙණිය වට කළ චන්ද්‍රභානු දන්ත ධාතුව, පාත්‍ර ධාතුව හා රාජ්‍යය තමන්ට ලබා දෙන ලෙස රජුට තර්ජනය කළේය. රජුගේ හමුදාව හා චන්ද්‍රභානුගේ හමුදාව අතර නැවත වරක් ප්‍රබල සටනක් සිදු විය. මෙහි දී ඉන්දියාවේ පාණ්ඩ්‍ය අධිරාජ්‍යයෙන් ද දෙවන පරාක්‍රමබාහු රජතුමාට සහය ලැබුණු බව පෙනේ. මෙම සටනේ දී සතුරු හමුදාව යළිත් පරාජයට පත් වූ අතර ආක්‍රමණිකයා වූ චන්ද්‍රභානු ද ජීවිතක්ෂයට පත් විය. දෙවන පරාක්‍රමබාහු රජු සතුරන්ගෙන් රට බේරා ගැනීමට ක්‍රියා කරන අතර ම දේව පතිරාජ නම් ඇමතිවරයා යොදවා ආර්ථික, ආගමික හා



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

අධ්‍යාපනික අංශවල ද ප්‍රබල දියුණුවක් ඇති කිරීමට ක්‍රියා කළේය.

### යාපහුව

ක්‍රිස්තු වර්ෂයෙන් 1270 දී පමණ දෙවන පරාක්‍රමබාහු රජු මිය ගිය හෙයින් ඔහුගේ පුත් විජයබාහු කුමරු රජකමට පත් විය. ඔහු සිව්වන විජයබාහු ලෙස හැඳින්වේ. බෝසත් විජයබාහු ලෙස ද ප්‍රසිද්ධ වූ මෙතුමාගේ රාජ්‍ය කාලය වසර දෙකකට සීමා විය. රජ වාසල ඇති වූ හමුදා කුමන්ත්‍රණයකින් මෙම රජු ජීවිතක්ෂයට පත් විය. අනතුරුව සිව්වන විජයබාහු රජුගේ සහෝදරයා වූ භුවනෙකබාහු කුමරා කුමන්ත්‍රණකරුවන් මැඩ පවත්වා වර්ෂ 1272 පමණ බලයට පත් විය. පළමුවන බුවනෙකබාහු රජු ලෙස හැඳින්වෙන මෙතුමා ගැටලු රැසකට සාර්ථකව මුහුණ දුන් පාලකයෙකි. රජු බලයට පත් වූ අලුත ම වන්නි නායකයෝ පිරිසක් රජුට එරෙහිව කැරලි ඇති කළහ. මේ කාලයේ දී ම දකුණු ඉන්දියානු හමුදා කිහිපයක් ලංකාව ආක්‍රමණය කළහ. එක් ආක්‍රමණයක් මෙහෙය වූයේ කාලිංගරායර නම් සෙන්පතියෙකි. තවත් සේනාවක් චෝඩගංග නම් සේනාපතියෙක් විසින් මෙහෙය වන ලදී. මෙම සතුරු උවදුරුවලට සාර්ථකව මුහුණ දුන් රජු දඹදෙණියේ වසර කිහිපයක් ගත කොට අනතුරුව වඩාත් ආරක්ෂාකාරී ස්ථානයක් වූ යාපහුව තම අගනුවර වශයෙන් තෝරා ගත්තේ ය. පළමුවන භුවනෙකබාහු රජු විදේශ රටවල් සමඟ වෙළෙඳ සබඳතා ඇති කර ගැනීමට දැඩි උනන්දුවක් දක්වූ අයෙකි. මෙම රජතුමා විසින් ලංකාව සමඟ වෙළෙඳ සබඳතා ඇති කර ගැනීම පිණිස සාකච්ඡා කිරීමට ඊජිප්තුවේ සුල්තාන් වෙත යවන ලද තානාපතිවරු පිරිසක් වර්ෂ 1283 අප්‍රේල් මාසයේ දී ඊජිප්තුවේ කයිරෝ නගරයේ දී පිළිගත් බව වාර්තා වේ. එයට නොබෝ කලකට පසු වර්ෂ 1284 දී පළමුවන භුවනෙකබාහු රජතුමා මිය ගියේය.

භුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසුව ඉහත කී බෝසත් විජයබාහු රජුගේ පුත් පරාක්‍රමබාහු නම් කුමාරයා සහ පළමුවන භුවනෙකබාහු රජුගේ පුත් දෙවන භුවනෙකබාහු කුමාරයා අතර රජකම පිළිබඳ මත ගැටුමක් ඇති වූ බව පෙනේ. මේ අවස්ථාවේ දී දකුණු ඉන්දියාවේ ප්‍රාදේශීය නායකයෙකු වූ ආර්ය චක්‍රවර්තී නැමැත්තෙක් යටතේ පාණ්ඩ්‍ය හමුදාවක් ලංකාවට පැමිණ යාපහුව බලකොටුවට පහර දී දළදාව රැගෙන ඉන්දියාවට ගොස් පාණ්ඩ්‍ය රජු වූ කුලශේකරට භාර දී ඇත. පසුව ඉහත කී බෝසත් විජයබාහු රජුගේ පුත් පරාක්‍රමබාහු කුමරා ඉන්දියාවට ගොස් කුලශේකර රජු හමු වී සාකච්ඡා කොට දළදාව නැවත ලබා ගෙන මෙරටට පැමිණ පොළොන්නරුවට ගොස් එහි පාලන කටයුතු මෙහෙය වීය. තෙවන පරාක්‍රමබාහු ලෙස හඳුන්වන එම රජුගේ රාජ්‍ය කාලය ආරම්භ වූයේ ක්‍රි.ව 1287 දීය. එහෙත් ක්‍රි.ව 1293 දී පමණ පොළොන්නරුව වැටලූ දෙවන භුවනෙකබාහු කුමරා ඉහත කී තෙවන පරාක්‍රමබාහු රජු පරාජය කොට දළදාව රැගෙන කුරුණෑගලට පැමිණ එය තම අගනුවර බවට පත් කර ගත්තේය.




*සැලසුම අංක 7.4 පැරණි කුරුණෑගල නගරයේ සැලැස්ම දක්වන සටහනක්*

### කුරුණෑගල

කුරුණෑගල රාජධානිය පිහිට වූ ප්‍රථම පාලකයා ඉහත කී පරිදි දෙවන භුවනෙකබාහු රජු වේ. එතුමාගේ රාජ්‍ය කාලය වර්ෂ 1293 සිට වසර 9 ක පමණ කාලයක් යැයි පිළිගැනේ. දෙවන භුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසුව ඔහුගේ පුත් පරාක්‍රමබාහු කුමාරයා කුරුණෑගල රජවිය. මෙරට ඉතිහාසයේ හතරවනවරට හමුවන පරාක්‍රමබාහු රජු ඔහු බැවින් එතුමා සිව්වන පරාක්‍රමබාහු රජු ලෙස හැඳින්වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සරජෝතිමාලෙ නම් ද්‍රවිඩ කාව්‍යයේ සඳහන් පරිදි වර්ෂ 1302 දී හෙතෙම රජකමට පත්ව ඇත.

කුරුණෑගල රාජ්‍ය සමයේ දී බුදු දහමේ උන්නතියට මෙන් ම අධ්‍යාපනික හා ශාස්ත්‍රීය අංශයට විශාල සේවයක් සිදුව ඇත. එතෙක් පාලි භාෂාවෙන් පැවති පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම මේ යුගයේ සිදු වූ කැපී පෙනෙන සේවයකි. දළදා සිරිත, සිංහල බෝධි වංසය, අනාගත වංසය හා දළදා පූජාවලිය වැනි ග්‍රන්ථ මේ කාලයේ දී රචනා වී ඇත. හතරවන පරාක්‍රමබාහු රජුට පසුව තෙවන භුවනෙකබාහු හෙවත් වන්නි භුවනෙකබාහු සහ සිව්වන විජයබාහු හෙවත් සවුළු විජයබා යනුවෙන් රජවරු දෙදෙනෙක් පිළිවෙළින් කුරුණෑගල පාලන කටයුතු ගෙන ගිය බව සඳහන් වේ. මෙම රජවරුන්ගේ කටයුතු පිළිබඳ වැඩි විස්තර අනාවරණය වී නැත. එහෙත් තුන්වන භුවනෙකබාහු රජු විසින් කුරුණෑගල වැව තනවන ලද යි ජනප්‍රවාදවල සඳහන් වේ.

## ගම්පොළ රාජධානිය

වර්ෂ 1341 දී සිව්වන භුවනෙකබාහු රජතුමා විසින් ගම්පොළ රාජධානිය පිහිටුවන ලදී. මෙම රජු කුරුණෑගල අවසන් පාලකයා වූ සවුළු විජයබාහු රජුගේ පුතෙක් යැයි පිළිගැනේ. සිව්වන භුවනෙකබාහු රජුට තවත් සහෝදරයෙක් සිටි අතර පස්වන පරාක්‍රමබාහු රජු ලෙස හැඳින්වෙන හෙතෙම සමකාලීනව දැදිගම රාජධානියක් ගොඩනගාගෙන පාලන කටයුතුවල නිරත විය. ගම්පොළ රාජ්‍ය සමය ආරම්භ වන විට දැදිගමට අමතරව තවත් රාජධානි දෙකක් බිහිව තිබුණි. ආර්ය චක්‍රවර්තී රජ පෙළපත යටතේ යාපන රාජධානිය පිහිටුවා තිබූ අතර අලකේශ්වර පරපුර විසින් රයිගම වෙනම රාජධානියක් පවත්වාගෙන යන ලදී. මේ නිසා ගම්පොළ රාජධානියට බොහෝ අභියෝග වලට මුහුණ දීමට සිදු විය.


ගම්පොළ රාජ්‍ය සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ කිහිපයකි. ගම්පොළ රජ පරපුර සමඟ සබඳතා ගොඩනගා ගෙන සිටි කැපී පෙනෙන ප්‍රභූ පවුල් දෙකක් සිටීම එක් ලක්ෂණයකි. ගම්පොළ සිටි සේනාලංකාධිකාර සෙනවිරත් පවුල ඉන් එකකි. සේනාධිලංකාර සෙනවි දැදිගම පරාක්‍රමබාහු රජුගේ සහෝදරියක් විවාහ කරගෙන සිටි අතර III වික්‍රමබාහු නමින් ගම්පොළ පසුව රජ වූයේ එම දෙපලගේ පුතෙකි. රයිගම සිටි අලකේශ්වර පවුල ඉහත කී දෙවන ප්‍රභූ පවුල වේ. මෙම පවුලේ කැපී පෙනෙන තැනැත්තා නිශ්ශංක අලකේශ්වර වේ.

ගම්පොළ රාජ්‍ය සමයේ රජකම උරුම වූයේ පියාගෙන් පුතාට හෝ සහෝදරයාගෙන් සහෝදරයාට රජකම ලැබුණු පැරණි ක්‍රමයට නොව මාමාගෙන් පසු බෑනාට හෙවත් හිටපු රජුගේ සහෝදරියකගේ පුතෙකුට ය. මෙය පියාගෙන් පුතාට රාජ්‍යය උරුම වීමේ පීතෘ මූලික උරුමයට වඩා මව් පාර්ශ්වයෙන් රාජ්‍ය උරුම වීමේ මාතෘ මූලික උරුම ක්‍රමයකි.

ගම්පොළ රාජ්‍ය සමයේ දී ඉබන් බතුතා නම් අරාබි සංචාරකයෙකු ලංකාවට පැමිණ තමන් ඇසූ දුටු දේ වර්තා කර තැබීම වැදගත් කරුණකි. වර්ෂ 1344 දී යාපනයට පැමිණි ඉබන් බතුතා එහි පාලකයා වූ ආර්ය චක්‍රවර්තිගෙන් උපකාර ලබා ගෙන ශ්‍රී පාද වන්දනාවට ගොස් ඇත. සුදු ඇතෙකු තබාගෙන සිටි අලකෝනාර් නම් ස්වාධීන පාලකයෙකු ගැන බතුතා සඳහන් කරයි. එකී අලකෝනාර් යනු අලගක්කෝනාර පරපුරේ අයෙකි.

ගම්පොළ තෙවන වික්‍රමබාහු රජුගේ පාලන කාලය වන විට උතුරේ සිටි ආර්යචක්‍රවර්තිගේ නිලධාරීන් ගම්පොළ රාජ්‍යයට පැමිණ ඇතැම් ප්‍රදේශවලින් බදු අය කළ බව සඳහන් වේ. මෙය ගම්පොළ රාජ්‍යයේ ස්වාධීනත්වයට කැළලක් වූවා මෙන්ම ආර්ථිකයට ද පහරක් විය. මේ නිසා රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා වූ නිශ්ශංක අලකේශ්වර කෝට්ටේ බලකොටුවක් තනා හමුදව රැස් කර ආර්යචක්‍රවර්ති රජුගේ බදු නිලධාරීන්ට දඬුවම් පමුණුවා තිබේ. මෙයින් කිපුණු ආර්ය චක්‍රවර්ති ගම්පොළ රාජ්‍ය ආක්‍රමණය කළ විට අලකේශ්වරගේ හමුදව විසින් එකී හමුදව පරාජයට පත් කරන ලදී. නිශ්ශංක අලකේශ්වර අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා ගම්පොළ රාජ්‍ය ශක්තිමත් වුවත් පසුකාලය වන විට අලකේශ්වර පවුල අතරම මතභේද ඇති වූ බව පෙනේ.

ගම්පොළ රාජ්‍යයේ අවසාන කාලයේ චීන ආක්‍රමණයක් මෙරටට එල්ල විය. චීනයේ යුංලෝ නමැති අධිරාජයා විසින් එවන ලද චෙන් හෝ සෙනවියා වර්ෂ 1405, 1409 හා 1411 යන වසරවල ලංකාවට ගොඩබැස ඇත. හෙතෙම 1409 දී මෙරටට පැමිණි විට රයිගම සිටි වීර අලකේශ්වර නම් පාලකයා චෙන් හෝ සෙනවියා නිසි පරිදි පිළිගෙන නැත. මේ නිසා හෙතෙම තමා ගෙනා පුද පඬුරු දෙවුන්දර දේවාලයට පුද චීන, පර්සියානු හා දෙමළ භාෂාවලින් ශිලා ලිපියක් ද පිහිටුවා ආපසු ගොස්




*සිතියම 7.1 ශ්‍රී ලංකාවේ පැරණි රාජධානි මධ්‍යස්ථානවල ව්‍යාප්තිය*

ඇත. එම ලිපිය ගාල්ලේ ත්‍රිභාෂා ලිපිය නමින් හැඳින්වේ. අනතුරුව 1411 දී විශාල හමුදවක් සමඟ නැවත මෙරටට පැමිණි චෙන් හෝ සෙනවියා වීර අලකේශ්වරගේ හමුදව සමඟ සටන් කොට වීර අලකේශ්වර ඇතුළු පිරිසක් සිරකරුවන් ලෙස අල්ලාගෙන ආපසු ගියේය.

ගම්පොළ රාජ්‍ය සමයේ ඉදි කළ ගොඩනැගිලි කිහිපයක් තවමත් ඉතිරිව ඇති අතර සිව්වන භුවනෙකබාහු රජු විසින් කරවන ලද ලංකාතිලක විහාරය හා ගඩලාදෙණි විහාරය ඒ අතර කැපී පෙනේ.

### කෝට්ටේ රාජධානිය

ගම්පොළ රාජ්‍ය සමයේ දී නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදි කර වූ බව ඉහත සඳහන් කෙරිණි. එහෙත් කෝට්ටේ රාජධානිය පිහිටුවන ලද්දේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසිනි. එතුමාගේ පියා ජයමහලැන නැමැත්තෙකි. මව සුනේත්‍රා දේවිය යි. ගම්පොළ රාජ්‍ය අවසාන කාලයේ පැවති සතුරු උවදුරු නිසා පරාක්‍රමබාහු කුමරාට රහසිගතව ඇති දැඩි වීමට සිදු විය. මෙහි දී වීදගම මහා ස්ථවිරයන් වහන්සේ කුමරාට අවශ්‍ය රැකවරණය සලසා දී ඇත. අනතුරුව වීදගම හිමියන්ගේ අනුග්‍රහයෙන් වර්ෂ 1412 දී පරාක්‍රමබාහු කුමරු රයිගම බලයට පැමිණියේ ය. වසර තුනකට පසුව එතුමා වඩාත් ආරක්ෂාකාරී ස්ථානයක් ලෙස ප්‍රකටව පැවති කෝට්ටේ ට පැමිණ වර්ෂ 1415 දී තම අභිෂේක උත්සවය පැවැත්වීය. එතැන් සිට වර්ෂ 1467 දක්වා දිගු කාලයක් එතුමා මෙරට පාලනය කළේය. හයවන පරාක්‍රමබාහු රජතුමා ඉටු කළ සේවයේ කැපී පෙනෙන කරුණු මෙසේ ය.

- වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කිරීම
- සපුමල් කුමාරයා යටතේ හමුදව යවා යාපනය ජය ගැනීම
- උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම
- කෝට්ටේ රාජධානිය යටතේ රට එක්සත් කොට ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම
- රටේ අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවල දියුණුවට විශාල සේවයක් සිදු කිරීම

හයවන පරාක්‍රමබාහු රජුගෙන් පසු රාජ්‍ය උරුම වීමට පුතෙක් නොසිටි බැවින් එතුමාගේ අභාවයෙන් පසුව රජුගේ දියණිය වූ උලකුඩය දේවියගේ පුතා ජයබාහු යන නමින් රජකමට පත් කෙරිණි. එහෙත් එතුමාගේ රාජ්‍ය කාලය ඉතා කෙටි එකක් විය. හයවන පරාක්‍රමබාහු රජු යාපනය යටත් කිරීමෙන් පසු එම ප්‍රදේශ පාලනයට යොදවා සිටි සපුමල් කුමරා හමුදවක් රැගෙන පැමිණ කෝට්ටේ අගනුවර වටලා ජයබාහු රජු ජීවිතක්ෂයට පත් කොට බලය අල්ලා ගත්තේය. වර්ෂ 1469 දී හෙතෙම හයවන භුවනෙකබාහු නමින් රජ විය. ඔහුගේ පාලනය ආරම්භ වූ කාලයේ දී ම පස්යොදුන් රට සිංහල පෙරළිය හෝ සිංහල සංගෙ නමින් හඳුන්වන කැරැල්ලක් ඇති විය. භුවනෙකබාහු රජුගේ මෙහෙයවීම මත අම්බුලුගල කුමාරයා විසින් මේ කැරැල්ල මැඩ පවත්වන ලදී. අත් අඩංගුවට පත් කැකුලන්දල සිරිවර්ධන පතිරාජ ඇතුළු කැරලි නායකයන්ට පසුව රජුගේ සමාව ලැබුණි. ඒ සඳහා පිහිට වූ අභයදන ශිලා ලිපිය දූදිගම සෙල්ලිපිය ලෙස හැඳින්වේ.

හයවන භුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසු එතුමාගේ පුතෙක් වන පණ්ඩිත පරාක්‍රමබාහු බලයට පැමිණියේය. හත්වන පරාක්‍රමබාහු ලෙස හැඳින්වෙන එතුමාගේ රාජ්‍ය කාලය ද දිගු එකක් නොවීය. සතර කෝරළය ප්‍රදේශයේ පාලන කටයුතු භාරව සිටි අම්බුලුගල කුමාරයා පැමිණ පණ්ඩිත පරාක්‍රමබාහු බලයෙන් පහ කොට අටවන වීර පරාක්‍රමබාහු නමින් රජ විය. එතුමා බලයට පැමිණියේ වර්ෂ 1490 දී පමණ යැයි පිළිගැනේ. එම රජුගේ පාලන කාලයේ දී හෙවත් වර්ෂ 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණුනි.

### යාපනය සහ වන්නියාර්වරු

ක්‍රි.ව. දහතුන්වන සියවසේ රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු යාපන ප්‍රදේශය ආශ්‍රිතව බිහි වූ පාලන ඒකකය යාපන රාජධානිය ලෙස හැඳින්වේ. මෙම රාජධානියේ ආරම්භය හා ඉතිහාසය පිළිබඳ සමකාලීන මූලාශ්‍රය නොමැති අතර එහි ඉතිහාසය හැදෑරීමට ඇති වඩාත් ප්‍රකට කෘතිය යාල්පාන වෛපව මාලෛයි නම් ග්‍රන්ථය වේ. එහෙත් එය 18

වන සියවසේ දී පමණ රචනා වූ එකකි. ඊට අමතරව කෛලාය මාලෛ සහ ශේගරාශශේකර මාලෛ වැනි දෙමළ ග්‍රන්ථ ද මෙහිදී වැදගත් වේ.

යාපන රාජධානියේ ආරම්භකයා විජය කුලංකෙ ආර්ය චක්‍රවර්තී ලෙස සැලකේ. ඔහුගේ පාලන කාලයේ සිට පෘතුගීසීන්ගේ පැමිණීම තෙක් යාපන ප්‍රදේශය පාලනය කළ කුලශේකර, වික්කිරම, වරෝදය, මාර්තණ්ඩ වැනි පාලකයන් දෙළොස් දෙනෙකු පිළිබඳ විස්තරයක් යාල්පාන වෛපව මාලෛයි ග්‍රන්ථයෙහි දක්වා තිබේ. යාපනයේ පාලන කටයුතු ගෙන ගිය රජ පරපුර ආර්ය චක්‍රවර්තීවරුන් ලෙස හඳුන්වා ඇත. වර්ෂ 1344 දී ඉබන් බතූතා මෙරටට පැමිණෙන විට ආර්ය චක්‍රවර්තීවරුන් තරමක ශක්තිමත් පාලනයක් ගෙන ගිය බව පෙනේ. ගම්පොළ රාජ්‍ය සමයේ දී ගම්පොළට අයත් ප්‍රදේශවල බදු අය කළ ආර්ය චක්‍රවර්තීගේ නියෝජිතයන්ට එරෙහිව නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා කටයුතු කළ ආකාරය මීට ඉහත දී සඳහන් කෙරිණ. කෝට්ටේ රාජ්‍ය සමයේ දී හයවන පරාක්‍රමබාහු රජු සපුමල් කුමාරයා යවා යාපන ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයට යටත් කළේය. හයවන පරාක්‍රමබාහු රජුගෙන් පසුව යාපන ප්‍රදේශයේ පාලනය කෝට්ටේ රාජධානියෙන් ගිලිහිණ. එතැන් සිට පෘතුගීසීන්ට යටත්වන තෙක් යාපන රාජධානියේ තොරතුරු දහවන පාඩමේ දී සාකච්ඡා කෙරේ.

### වන්නියාර්වරු

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු නැගෙනහිර, උතුරු මැද හා වයඹ පළාත්වල ජන සනත්වය අඩු ප්‍රදේශ ආශ්‍රිතව වන්නි වශයෙන් හැඳින්විය හැකි කුඩා පාලන ඒකක කිහිපයක් නිර්මාණය වූ බව පෙනේ. මේවායේ සිටි ප්‍රදේශීය අධිපතියන් වන්නිවරු ලෙස හඳුන්වති. පූජාවලිය නම් ග්‍රන්ථයේ කියා ඇති ආකාරයට දඹදෙණි රාජධානිය පිහිටි වූ තෙවන විජයබාහු රජු මුලදී වන්නි නායකයෙකු ලෙස කටයුතු කළ අයෙකි. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ කාලය ආරම්භ වන විට මෙබදු වන්නි ප්‍රදේශ දහ අටක් පැවති බව සමකාලීන මූලාශ්‍රවල සඳහන් වේ. මධ්‍යම රාජධානිය දුර්වලව පැවති අවස්ථාවල වන්නියාර්වරු කිසියම් ස්වාධීනතාවක් බුක්ති වින්ද ද දෙවන පරාක්‍රමබාහු, හයවන පරාක්‍රමබාහු වැනි රජවරුන්ගේ කාලවල වන්නි ප්‍රදේශ ප්‍රධාන රාජධානියට යටත් කෙරිණි. උඩරට රාජධානි සමයේ දී නැගෙනහිර ප්‍රදේශයේ වන්නිවරුන් සිටි බවට තොරතුරු තිබේ. එහෙත් ඔවුන් උඩරට රජුගේ බලයට යටත් වූ පිරිසකි.

### 7.4.1 ආර්ථික රටාව

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු තෙත් කලාපීය ප්‍රදේශ කරා සංක්‍රමණය වූ ජනතාවට නව භූගෝලීය පරිසරයකට හැඩ ගැසීමට සිදු විය. දුර්ග ආශ්‍රිත ප්‍රදේශයන්හි රාජධානි බිහි වීමත්, අගනුවර වැඩි කලක් එක් ස්ථානයක නොපැවතීමත්, මෙහි විශේෂිත ලක්ෂණයකි. තෙත් කලාපයට වර්ෂාව හොඳින් ලැබුණු බැවින් මහ වැව් හා වාරි මාර්ග ඉදි කිරීමට වැඩි අවධානයක් යොමු නොකළ බවක් පෙනේ. කෘෂිකාර්මික කටයුතු සඳහා අහස් දිය යොද ගැනීමට ඔවුහු පෙලඹුණහ. මෙකළ ද ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය. ප්‍රධාන වගාව වී වගාව වූ අතර ජලය හිඟ ප්‍රදේශයන් හි හේන් ගොවිතැන් කළහ.

ක්‍රම ක්‍රමයෙන් මොවුහු වාණිජ ආර්ථික රටාවකට නැඹුරු වූහ. ආහාර සඳහා වවන ලද භෝග වල අතිරික්තය වෙළෙඳාම සඳහා යොමු කෙරිණි. එයට හේතු වූයේ විදේශ රටවල් සමඟ පැවති වෙළෙඳ සබඳතා තව තවත් වර්ධනය වීම යි.

තෙත් කලාපයේ වනගතව වැවුණු කුරුඳු මෙකළ ප්‍රධාන වෙළෙඳ බෝගයක් විය. පුවක්, ගම්මිරිස්, එනසාල්, සාදික්කා වැනි බෝගවල අතිරික්තය අපනයනය සඳහා යොමු කෙරිණි. ඊට අමතරව මුතු, මැණික්, ඇතුන් හා ඇත් දළ වැනි වෙළෙඳ භාණ්ඩ ද අපනයනය කළහ.

ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව වැනි රටවල් සමඟ ශ්‍රී ලංකාව වෙළෙඳ සබඳතා පවත්වා තිබේ. විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතුණි.

එකල ලංකාවේ පැවති සරුසාර වෙළෙඳාම සම්බන්ධව සාහිත්‍ය හා පුරා විද්‍යාත්මක මූලාශ්‍රය වල මෙන්ම දේශාටන වාර්තාවල ද සඳහන් වී තිබේ. චීනයෙන් ශ්‍රී ලංකාවට පිඟන් භාණ්ඩ ආනයනය කළ බවට දැදිගම ප්‍රදේශයෙන් ලැබුණු පුරා විද්‍යාත්මක සාක්ෂි වලින් හෙළිදරව් වේ. අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ කඩ වීදි තිබූ බව කුරුණෑගල විස්තරය නම් පුස්කොළ පොතේ සඳහන් වේ. ලංකාවේ බටහිර

වෙරළබඩ නැව් තොටු ආශ්‍රිතව සරුසාර වෙළඳාමක් පැවති බව ක්‍රි.ව.1344 දී ශ්‍රී ලංකාවට පැමිණි ඉබන් බතූතා නම් මුස්ලිම් දේශ සංචාරකයාගේ වාර්තාවල සඳහන් වේ.

### 7.4.2 ආගම

දෙවන නාගරීකරණ සමයේ දී ද ප්‍රධාන ආගම වශයෙන් බුදු දහම තව දුරටත් වර්ධනය විය. දඹදෙනි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා දළදා වහන්සේ වෙනුවෙන් දළදා මන්දිර තැනවීම හා බොහෝ වෙහෙර විහාර ඉදි කිරීමට රජවරු කටයුතු කළහ. මෙකළ ජනතාව දෙවියන් කෙරෙහි මහත් භක්තියකින් හා විශ්වාසයකින් කටයුතු කළ බවට සාධක තිබේ. උපුල්වන්, විභීෂණ, ස්කන්ධකුමාර, සමන් ආදි දෙවිවරු ඇදහීමත් එම දෙවියන් වෙනුවෙන් දේවාල මන්දිර ඉදි කිරීමත් පැවතුණි. සන්දේශ සාහිත්‍ය කෘතිවල ද උපුල්වන් විභීෂණ දෙවිවරු පිළිබඳ සඳහන් වී තිබේ.

පහළොස්වන සියවසේ පමණ ශිව දේවාලයක් ශ්‍රී ජයවර්ධනපුරයට යාබදව තිබූ බවට තොරතුරු හෙළි වේ. හින්දු භක්තිකයන් උදෙසා එම දේවාලය ඉදි වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

හලාවත මුන්නේශ්වරම් කෝවිල, මෙකල හින්දු බැතිමතුන්ගේ පූජනීය ස්ථානයකි.

විදේශ වෙළඳ කටයුතුවල නියැළුණු මුස්ලිම් බැතිමතුන් පදිංචිව සිටි මුහුදු තොටුපළවල් ආශ්‍රිතව ඔවුන්ගේ පූජනීය ස්ථාන පැවතිණ.

### 7.4.3 කලාව හා ගෘහ නිර්මාණය

යාපහුවේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා කාලයේ බිහි වූ නගරවල ගෘහ නිර්මාණ කලාවන් රාශියක් අද ද දැකගත හැකි වේ. මෙම ගෘහ නිර්මාණ සඳහා දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පීය ආභාසය ලැබී තිබීම සුවිශේෂ ලක්ෂණයකි.

යාපහුව රාජධානියේ දක්නට ලැබෙන පිටගැට පෙළ හා එහි කුලුනු නිර්මාණය සඳහා පාණ්ඩ්‍ය හා කාම්භෝජ ආභාසය ලබා ඇති බව විශ්වාස කෙරේ.

ගම්පොළ යුගයට අයත් ගඩලාදෙණි විහාරයේ ඇති පිළිම ගෙය සමකාලීන දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශෛලියේ ආභාසය ලබා තිබීම පැහැදිලිව දක්නට ලැබේ.

පිළිම ගෙයට සම්බන්ධ කොට දේවාල ඉදි කිරීම ද මෙම යුගවල දී දක්නට ලැබෙන තවත් ලක්ෂණයකි.

ගඩලාදෙනි පිළිම ගෙයට සම්බන්ධ කොට උපුල්වන් දෙවියන් උදෙසා දේවාලයක් තනා තිබීම මෙයට එක් උදාහරණයකි. ලංකාතිලක පිළිම ගෙයට සම්බන්ධකොට ද මෙලෙස දේවාල ඉදි කොට තිබේ. පිළිම ගෙවල් තුළ මෙලෙස දේවාල දක්නට ලැබීම හින්දු හා මහායාන අදහස් ගෘහ නිර්මාණ ශිල්පය කෙරේ බලපෑ බවට සාධකයකි.

ගම්පොළ යුගයේ තුන්වන වික්‍රමබාහු රජු විසින් කරවන ලද ඇම්බැක්කේ දේවාලය අගනා ලී කැටයම් සහිත ගොඩනැගිල්ලකි. එහි ඇති අගනා ලී කැටයම් සහිත කණු හා දැවමය වහලය එහි අපූර්වත්වය විදහාපායි.

දෙවන නාගරීකරණ සමයේ භාෂාව හා සාහිත්‍යයේ විශාල ප්‍රබෝධයක් ඇති වූ බවට බොහෝ සාධක තිබේ. මෙහි පැවිදි උගත් පඬිවරුන් බිහි වීම සාහිත්‍ය දියුණුව සඳහා රජවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලැබීම, අධ්‍යාපන මධ්‍යස්ථාන රැසක් බිහිවීම සාහිත්‍ය උන්නතිය කෙරෙහි බලපෑවේය.

දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ බොහෝ සාහිත්‍ය පත පොත ලියැවුණි. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලද එතුමා විසින් ද සාහිත්‍ය කෘති කිහිපයක් ලියා තිබේ. සිංහලයේ මහා කාව්‍යයක් වන කව්සිළුමිණ දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචිත බවට පිළිගැනේ. ධර්මසේන හිමියන් ලියූ සද්ධර්මරත්නාවලිය, මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි ලියූ පූජාවලිය දඹදෙණි යුගයේ රචිත වැදගත් ගද්‍ය ග්‍රන්ථ දෙකකි. සිංහල ව්‍යාකරණ පිළිබඳ ලියැවුණු සිදත් සඟරාව, කාව්‍යකරණය පිළිබඳ නීති ඇතුළත් එළු සඳැස් ලකුණ මෙම යුගයට අයත් වේ. භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම පිළිබඳ විනය නීති රීති ඇතුළත් දඹදෙණි කතිකාවත, දෙවන පරාක්‍රමබාහු රජුගේ දින චර්යාව ඇතුළත් කඳවුරු සිරිත, මෙන්ම බුද්ධ පුත්‍ර හිමියන් රචනා කළ යෝගාර්ණවය නම්

වටිනා වෙද පොත ද දඹදෙණි සමයේ ලියැවුණි. මෙකල පාලි භාෂාවෙන් ලියැවුණු වැදගත් කෘති කිහිපයක් ද වේ. විශුද්ධි මාර්ග සන්නස, සමන්තකූට වර්ණනා, රසවාහිනී, සාර සංග්‍රහය, භේසජ්ජ මංජුසා නම් වෙද පොත, හත්ථවනගල්ල විහාර වංසය හා ථූප වංසය උදහරණ වේ.

කුරුණෑගල සමයේ සිංහල ගද්‍ය සාහිත්‍ය තව දුරටත් පෝෂණය විය. පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම, දළදා සිරිත, දළදා පූජාවලිය, සිංහල බෝධි වංසය මේ යුගයේ රචිත මහඟු කෘතීන් ය.

ගම්පොළ යුගයේ දී සන්දේශ කාව්‍ය ලිවීම ආරම්භ විය. මයූර සන්දේශය හා තිසර සන්දේශය පැරණිම සන්දේශ සාහිත්‍ය කෘති දෙක ලෙස සැලකේ. පාරමී ශතකය, ජිනබෝධාවලී, බාලාවතාර වැනි පාලි සාහිත්‍ය කෘතීන් ද සද්ධර්මාලංකාරය ද මේ යුගයේ ලියැවුණු සාහිත්‍ය කෘතී කිහිපයකි.

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකි ය. හයවන පැරකුම්බා රාජ්‍ය සමය සාහිත්‍යයට අගනා මෙහෙවරක් ඉටු වූ කාල පරිච්ඡේදයකි. හයවන පරාක්‍රමබාහු රජු ශ්‍රේෂ්ඨ නරපතියෙකුසේ ම උගත් පඬිරුවනකි. මෙකල සාහිත්‍යයේ දියුණුවට කටයුතු කළ උගත් පඬිවරු රාශියකි.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, කැරගල වනරතන හිමි, ඉරුගල් කුලතිලක පිරිවෙන් හිමි වැනි උගත් හිමිවරු මෙකල සාහිත්‍යයේ දියුණුවට මහත් සේවයක් ඉටු කළහ.

පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය,හංස, පරෙවි, ගිරා, සැළලිහිණි, ආදි සන්දේශ කාව්‍යය ද මේ උගතුන් අතින් බිහි වූ කෘතීන් ය.

භක්ති කාව්‍ය, ශිලෝ කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝෂ ග්‍රන්ථ ආදි වශයෙන් සාහිත්‍යකරණය විවිධ පැති වලට යොමු වීම මෙකළ සුවිශේෂී ලක්ෂණයකි. සංස්කෘත ග්‍රන්ථ ද රචනා වූ අතර භක්ති ශතකය ඊට උදහරණයකි.

බෞද්ධ අධ්‍යාපනික මධ්‍යස්ථාන රාශියක් ද මේ යුගයේ දී බිහිවුණි. හයවන පරාක්‍රමබාහු රජු තම මෑණියන් සිහිවීම පිණිස පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන ඉදි කළේය. කැරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන, වීදගම සනානන්ද පිරිවෙන ආදි බෞද්ධ මධ්‍යස්ථාන සාහිත්‍යයේ දියුණුවට මහත් සේවාවක් කළ විද්‍යස්ථානය.

### ක්‍රියාකාරකම

1. ශ්‍රී ලංකාවේ පැරණි නගර බිහි වීමට හා බිඳ වැටීමට බල පෑ හේතු සඳහන් කරන්න.
2. පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කරන්න.

| | | |
|---|---|---|
| අනුරාධපුර | ගම්පොළ | යාපහුව |
| පොළොන්නරුව | කෝට්ටේ | |
| දඹදෙණිය | කුරුණෑගල | |

### වැදගත් කරුණු

1. පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ රාජධානි වෙනස් වීමට බල පෑ එක් ප්‍රධාන සාධකයක් වූයේ නාගරික මධ්‍යස්ථාන වෙනස් වීම යි. එය එසේ වීමට රට අභ්‍යන්තරයේ පැන නැගුණු තත්ත්ව මෙන් ම අන්තර්ජාතික වෙළෙඳාමේ සිදු වූ වෙනස්කම් ද බලපෑමක් ඇති කළේ ය.
2. පැරණි යුගයේ මෙරට නගර බිහි වීමේ ක්‍රියාවලිය පළමුවන නාගරීකරණය සහ දෙවන නාගරිකරණය යනුවෙන් ක්‍රියාවලි දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි ය. මෙම ක්‍රියාවලින් දෙක මඟින් පැන නැගුණු නගරවලට අයත් නාගරික සැලසුම්වල පැහැදිලි වෙනස්කම් දක්නට තිබේ.
3. නාගරීකරණ ක්‍රියාවලිය සහ නගර කේන්ද්‍ර කොට ගෙන සිදු වූ ක්‍රියාමාලා අවබෝධ කර ගත යුත්තේ එම ක්‍රියාවලි හට ගත් සමාජදේශපාලනික පසුබිම තුළ ය.
4. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ වශයෙන් රාජධානි කිහිපයක් බිහි විය. යාපනය කේන්ද්‍ර කරගෙන යාපන රාජධානිය බිහි වී තිබුණි.
5. කෝට්ටේ රාජ සමයේ දී අධ්‍යාපනික හා සාහිත්‍ය අංශයේ විශාල ප්‍රබෝධයක් තිබුණි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.